පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව අංක 290
ආයතනයේ නම :- ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

	කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා	දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
01	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	මෙම අමාත්‍යාංශය 2020.08.09 දින පිහිටවනු ලැබූ නව රාජ්‍ය අමාත්‍යාංශයක් වේ. 2020 වසර අවසන් වන තෙක් රටේ පැවති කොවිඩ් වසංගත තත්වය මත රට වසා තැබීම, සාමාන්‍ය රාජකාරී සිදු නොවීම හා සංවර්ධන කටයුතු කිසිවක් ක්‍රියාත්මක නොවීම වැනි කරුණු මත 2020 වසරේ මාස 04 ට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට හැකියාවක් නොතිබුණි. 2021 වර්ෂය සඳහා ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය සඳහා වෙන් කර ඇති රු. මිලියන 1900 ට අදාල සංවර්ධන කටයුතු ද ආයෝජක ප්‍රවර්ධන මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.
02	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	ඉහත 01 ඡේදයේ සඳහන් කරුණු මත 2020 වර්ෂය් මාස 04 කාලය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කිරීමට අවස්ථාවක් නොලැබුණි. 2021 වසරේ අමාත්‍යාංශය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සම්බන්ධව ස්ථිර තීරණයකට එළඹීමට නොහැකි වූ බැවින් 2021 ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමද ගැටලුවක් විය.
03	මු.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020.08.09 දින අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු පුරප්පාඩුව පවතින අභ්‍යන්තර විගණක තනතුර සම්පූර්ණ කිරීමට ඉල්ලා 2020.09.25, 2021.02.18 දින ඉල්ලීම් කර ඇත. ඊට අමතරව පෞද්ගලික මට්ටමින් සාකච්ඡා කර නිළධාරියෙකු ලබා ගැනීමට උත්සහ දරා ඇතත් එය ද ව්‍යර්ථ වී තිබේ.

<table>
<tr><td>04</td><td>2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.</td><td>2020.08.09 මෙම අමාත්‍යාංශය පිහිටුවා ඇත.</td></tr>
<tr><td>05</td><td>සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.</td><td>අමාත්‍යාංශය සතු වාහන සියල්ලම (වාහන 10ක්) සංචාරක අමාත්‍යාංශයෙන් ලබාගත් ඒවා වන අතර,ඉන් 8 ක් මෙම අමාත්‍යාංශය වෙත පවරාගෙන ඇත. P H – 0669 වාහනයේ මුල් ලියාපදිංචි සහතිකය (කල්බදු ලිසිං ක්‍රමය යටතේ මිලදී ගෙන ඇති බැවින්) අදාල බැංකුවෙන් විමසීම් සිදු කර ඇතත් මේ දක්වා එවා නැත. P H -1207 වාහනය පවරා ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.</td></tr>
<tr><td>06</td><td>රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොනිබුණි.</td><td>වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103 104 අනුව කටයුතු කර ඇත.</td></tr>
<tr><td>07</td><td>අනුමත සිමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.</td><td>2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පිලිබඳ විස්තර පහත දැක්වේ.
<table>
<tr><th>සේවා වර්ගය</th><th>අනුමත සේවක සංඛ්‍යාව</th><th>තත්‍ය සේවක සංඛ්‍යාව</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ මට්ටම</td><td>13</td><td>6</td><td>7</td></tr>
<tr><td>තෘතික මට්ටම</td><td>1</td><td>-</td><td>1</td></tr>
<tr><td>ද්විතියික මට්ටම</td><td>30</td><td>20</td><td>10</td></tr>
<tr><td>ප්‍රථමික මට්ටම</td><td>13</td><td>5</td><td>8</td></tr>
<tr><td>තාවකාලික</td><td>4</td><td>2</td><td>2</td></tr>
<tr><td>කොන්ත්‍රාත්</td><td>-</td><td>2</td><td>(2)</td></tr>
<tr><td>එකතුව</td><td>61</td><td>35</td><td>26</td></tr>
</table></td></tr>
</table>

08	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	2020.08.09 මෙම අමාත්‍යාංශය පිහිටුවා ඇති බැවින් මේ පිලිබඳ කටයුතු කිරීමට කාලසීමාවක් ප්‍රමාණවත් නොවිය.
09	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මානව සම්පත් හිහය නිසා කොරෝනා වසංගතය හේතුවෙන් සංචරණ සීමා පැවතීම මත සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දුන් පුහුණු අවස්ථා සීමා විය.
10	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	2020.08.09 මෙම අමාත්‍යාංශය පිහිටුවා ඇත.

කේ.ඩී.එස්. රුවන්වන්ද්‍ර
ලේඛම්
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, වෛත්‍ය පාර, කොළඹ 01.